# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2112/35 - 2019 පෙබරවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) අනු ව්‍යවස්ථාව යටතේ ආරක්ෂක විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති විෂයයන් සහ කාර්යයන් සහ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා 2019.02.21 දින සිට පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයාට පවරා දී ඇති බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව මවිසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,<br>
ජනාධිපති,<br>
ආරක්ෂක අමාත්‍ය.

2019 පෙබරවාරි මස 21 වැනි දින,<br>
කොළඹ 03,<br>
ආරක්ෂක අමාත්‍යාංශය.


1A - G 29556 — 392 (2019/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

**(1) ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | • ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය පනත (2008 අංක 5) |
| | 2. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | • උපයෝගිතා හා පරිපූරක පනත (1985 අංක 40) |
| | 3. රණවිරු සේවා අධිකාරිය | • රණවිරු සේවා අධිකාරිය පනත (1999 අංක 54) |
| 2. රටෙහි අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යාම සඳහා සහාය වීම | 4. ආරක්ෂක සේවා පාසැල | |
| | 5. ජාතික ශිෂ්‍යභට බලකාය | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 3. වෘද්ධ රණවිරුවන් හා ආබාධිත සොල්දාදුවන් පිළිබඳ කටයුතු | 6. රක්නා ආරක්ෂණ ලංකා ලිමිටඩ් | |
| 4. ආරක්ෂක සේවා පිරිස් සඳහා උසස් අධ්‍යාපනය ලබා දීම | | |
| 5. ආරක්ෂක සේවා පිරිස්වල දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධ කටයුතු | | |
| 6. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදළ කටයුතු | | |
| 7. II වැනි තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

03 - 777

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.